පු.වි.දෙපා. චක්‍රලේඛ 03/2018

මගේ අංකය : පුවි/1/1/දෙපා.චලේ.
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ 07.
2018.08.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන/ශාස්ත්‍රීය)
අධ්‍යක්ෂවරු/ ප්‍රධාන ගණකාධිකාරී/
නියෝජ්‍ය අධ්‍යක්වරු/ සහකාර අධ්‍යක්වරු/
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරු/
අංශ ප්‍රධානීන්වෙත,

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් පත්කරන ලද කාර්ය මණ්ඩලය සඳහා වන වාර්ෂික ස්ථානමාරු - 2019

### 1. හැඳින්වීම.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ xviii වැනි පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධාන අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් පත් කරන ලද කාර්ය මණ්ඩලය සඳහා වන වාර්ෂික ස්ථානමාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

### 2. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත් වන නිලධරයින් පිළිබඳ විස්තර

### 2.1 අදාල නිලධරයින්

| | |
|---|---|
| 1. සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 20. කැණීම් සහකාර |
| 2.කාර්මික නිලධාරී (සංරක්ෂණ සහකාර - විශේෂ ශ්‍රේණිය) | 21. කැණීම් හා කෞතුකාගාර සහකාර |
| 3. සැලසුම් ශිල්පී - විශේෂ ශ්‍රේණිය | 22. රසායනාගාර සහකාර |
| 4. ප්‍රාදේශීය කැණීම් හා කෞතුකාගාර නිලධාරී | 23. රසායන සංරක්ෂණ සහකාර |
| 5. ප්‍රාදේශීය ගවේශක | 24. නඩත්තු සහකාර |
| 6. ප්‍රාදේශීය සංරක්ෂක | 25. කාර්මික ශිල්පි (ජල, විදුලි, පැස්සුම්) |
| 7. ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු | 26. කැණීම් හා කෞතුකාගාර ශිල්පි |
| 8. ගවේෂණ නිලධාරී | 27. සංරක්ෂණ ශිල්පි |
| 9. කැණීම් නිලධාරී | 28. ශිලා ලේඛන එකතුකරන්නා |
| 10. කැණීම් හා කෞතුකාගාර නිලධාරී | 29. පෙදරේරු |
| 11. අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරී | 30. වඩුකාර්මික |
| 12. වැඩබිම් කළමනාකරු | 31. පින්තාරුකරු |
| 13. පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරි | 32. බංගලා භාරකරු |
| 14. සංවර්ධන නිලධාරි | 33. ප්‍රධාන රැකවල්කරු |
| 15. කාර්මික නිලධාරි (සංරක්ෂණ සහකාර) | 34. රැකවල්කරු |
| 16. සැලසුම් ශිල්පී | 35. මුරකරු |
| 17. පුරාවිද්‍යා ප්‍රතිරූපණ ශිල්පි | 36. පුරාවිද්‍යා සහායක |
| 18. කාර්මික සහකාර` | 37. කම්මල්කරු |
| 19. ගවේෂණ සහකාර | |

**2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය**

2.2.1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර තුනක් (03) සේවය කරන ලද නිලධරයින් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර පහකට (05) වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2.2.3 පහසු සේවා ස්ථානවල වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

2.2.4 එකම කලාපයක පහසු සේවා ස්ථානවල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධරයින් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට යටත් වේ.

**2.3. සේවා ස්ථාන වර්ග කිරීම.**

පහසු සහ දුෂ්කර සේවා ස්ථාන වර්ගීකරණය පහත දැක්වේ. (පවතින ප්‍රාදේශීය පුරාවිද්‍යා කොට්ඨාශ අනුව)

| පහසු ස්ථාන | දුෂ්කර ස්ථාන |
|---|---|
| බස්නාහිර (කොළඹ/ගම්පහ/කළුතර) | උතුර (යාපනය, කිලිනොච්චිය) |
| වයඹ (කුරුණෑගල/පුත්තලම) | වව්නියාව (මන්නාරම, වව්නියා, මුලතිව්) |
| කෑගල්ල | අම්පාර (අම්පාර, මඩකලපුව) |
| මධ්‍යම (නුවර/මාතලේ/නුවර එළිය) | මොණරාගල |
| ගාල්ල (ගාල්ල/මාතර) | හම්බන්තොට |
| බදුල්ල | පොලොන්නරුව |
| අනුරාධපුරය | ත්‍රිකුණාමලය |
| | රත්නපුර |

- තම නිවෙසට කිලෝමීටර් 30 දුරක් ඇතුලත වූ සේවා ස්ථානයක සේවය කිරීම පහසු ස්ථානයකි
- වැඩි දෙනෙකු සේවය කිරීම සඳහා ඉල්ලුම් කරන සේවා ස්ථානය පහසු සේවා ස්ථානයක් ලෙස සැලකේ.

**2.4. ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු**

I. වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධාරියෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කල හැකිය.

II. යම් සේවා ස්ථානයකට ස්ථානමාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) වැඩිම සේවා කාලයක් සපුරා ඇති නිලධරයින් එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

III. පහසු නොවන සේවා ස්ථානයක සේවය කල නිලධරයෙකු යම් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීමට ඉල්ලුම් කළ ස්ථානයේ වසර 05 කට වැඩි වුද වැඩිම සේවා කාලයක් සහිත වුද නිලධරයා ඉන් පිටතට මාරු කල හැක.

IV. පහසු ප්‍රදේශ වලට ස්ථාන මාරු වීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛත්වය දක්වන්නේ පහසු නොවන අති දුෂ්කර ස්ථාන වල සේවය කල නිලධාරින්ටය. මෙවැනි ස්ථාන මාරු වලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන්ද සලකා බලනු ලැබේ.

V. ස්ථාන මාරු කමිටුව විසින් නිලධරයන් මාරු කිරීමේදී අංශයේ, ප්‍රාදේශීය කාර්යාල වල සේවා අවශ්‍යතාවයන්ද ආයතන වල කාර්ය මණ්ඩල වල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකගැනීමට ද හැම විටම උත්සාහ කල යුතු වේ.

VI. මාරු කමිටුව වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කර නොමැත්තේ නම් ආයතන වලින් ලබා ගන්නා ලද කාර්ය මණ්ඩල විස්තර පදනම් කර ගෙන ස්ථාන මාරු කිරීමට අවකාශ ඇත.

### 2.4.1 සේවා කාලය ගණනය කිරීම

I වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාල ගණනය කරනු ලබනුයේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා: 2018 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2017.12.31 දිනය)

II සේවා කාලය ගණනය කිරීමේදී සේවා ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කල දිනය පසු දිනයක් වේ නම් ස්ථානමාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි. (තවද නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.)

### 2.4.2 පහසු සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීම

I. පහසු සේවා ස්ථානයක වසර 05 සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකුට නැවත පහසු සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කල හැක්කේ පහසු සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 10 ක් ගතවී ඇත්නම් පමණි.

II. සේවාවන් එකකට වැඩි ගණනක සේවය කල නිලධරයන්ගේ පහසු සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයකදී එම සේවයට පහසු වූ ආයතනයක සේවය කර ඇත්නම් එම සේවා කාලයද ගණන් ගනු ලැබේ. (උදා: කණිෂ්ඨ සේවක උසස් වීම් ලද නිලධරයන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය)

III. පහසු යැයි සැලකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා ස්ථාන සේවා කාලය ගණනය කිරීමේදී එම කාලය තුලදී ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත, අඩ වැටුප් හා වැටුප් රහිත) කාලය ගණනය කරනු නොලැබේ.

IV. පහසු සේවා ස්ථානයක සේවා කාලය ගණන් කිරීමේ දී එම පහසු සේවා ස්ථානයට අනුයුක්තව සේවය කල කාලයද ගණනය කරනු ලැබේ.

V. පහසු සේවා ස්ථානවල සේවය කරන නිලධරයින් විසින් නැවත පහසු ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථාන වලට පහසු නොවන සේවා ස්ථාන වල සේවය කල නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

## 03. <u>වාර්ෂික ස්ථානමාරු කමිටුවේ සංයුතිය</u>

අංක 1914/8 හා 2015.05.12 දිනැති ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 200 සංශෝධනයට අනුව දෙපාර්තමේන්තුවක හෝ අමාත්‍යාංශයක හෝ පිහිටුවනු ලබන වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1. අධ්‍යක්ෂ (නඩත්තු)/අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)/අධ්‍යක්ෂ (පාලන)
2. සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ)/ සහකාර අධ්‍යක්ෂ (කැණීම්)/ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු)
3. සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර)/සහකාර අධ්‍යක්ෂ (රසායන සංරක්ෂණ) / සහකාර අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)/ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා මෙහෙයුම්)
4. පරිපාලන නිලධාරි

5. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායමට අයත් නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත අඛණ්ඩ වාර්ෂික නිල වරණ පවත්වා ඇති ක්‍රියාකාරී ලියාපදිංචි සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම්කල නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්.

## 04. වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචනය කිරීම සඳහා එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටු වීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ. එම එක් එක් සමාලෝචන කමිටු වල සංයුතිය පහත පරිදි වේ.

1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)/ (ශාස්ත්‍රීය)
2. අධ්‍යක්ෂ (පාලන) හෝ ස්ථාන මාරු මණ්ඩලයේ සිටි අධ්‍යක්ෂවරයෙක්
3. ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු සහකාර අධ්‍යක්ෂවරයෙක්
4. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායමට අයත් නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත අඛණ්ඩ වාර්ෂික නිල වරණ පවත්වා ඇති ක්‍රියාකාරී ලියාපදිංචි සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම්කල නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්.

## 05. වාර්ෂික ස්ථානමාරු ලබාදීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

### 5.1 විශේෂිත කරුණු

1. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරීයේ දී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට එම නිලධරයාගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතුවේ. මෙවැනි නිලධරයන් පහසු සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් ඊට ආසන්නතම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරු කල යුතුය.

2. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානයට අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර, පහසු නොවන්නා වූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධරයින් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයින් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.

3. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

4. ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කරනු නොලැබේ.

5. ස්ථානමාරුවීම් නියෝග ලැබ සිටින නිලධාරියෙකුගේ එම මාරුවීම් ක්‍රියාත්මක වන දිනයෙන් පසු එම ආයතනයේ සේවයෙන් මුදාහැරීම මාරුවීම් ප්‍රතිපත්තියට පටහැනිය. මාරු මණ්ඩලය මගින් ආයතනයෙන් පිටතට ස්ථානමාරුවීම් ලබා ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකි වන සේ ඔවුන් මුදාහැරීමට කටයුතු කල යුතුය. ස්ථානමාරු නියෝග ලැබූ සියළුම නිලධාරීන් නියමිත දිනයේ දී නව සේවා ස්ථාන වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳි සිටිති.

6. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු කිරීම පිණිස අදාල බලධාරියා වෙත වාර්තා කරනු ලැබේ.

7. ස්ථාන මාරුවීම් ලැබෙයැයි අපේක්ෂිත නිලධාරීන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධාරියකුට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරු නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8. දරුවන් පාසල්යැවීමේ කටයුතු වලට අවහිරයක් නොවනු පිණිස හැකිතාක් දුරට සෑම මාරු කිරීමක්ම ක්‍රියාත්මක විය යුත්තේ එක් එක් අවුරුද්දේ ජනවාරි මස පළවෙනි දින සිටය.

**5.2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන්**

1. වයස අවුරුදු 57 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුල වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකල යුතුය.

2. වාර්ෂික ස්ථානමාරු සඳහා ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට (උදා: 2018 වර්ෂය සඳහා 2017.12.31 දිනට) අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකල යුතුය. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 59 ඉක්මවූ නිලධරයන් ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකල යුතුය.

**5.3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

1. කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ටාර්වරයා විසින් ලියාපදිංචි කරන ලද එහෙත් ආසන්නතම වර්ෂය සඳහා වාර්ෂික මහා සභා පවත්වා නිලවරණයකින් තෝරා පත්කර ගෙන ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ සේවය කරන්නන්ගේ වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයින් මාරු කරන්නේ නම් අදාල වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කල යුතුය.

2. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහය භුක්ති විඳීමට අපේක්ෂා කරන වෘත්තීය සංගම්වල නිලධරයින් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කොට ( ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උප වගන්තිය අනුව) ස්ථානමාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.2 උපවගන්තිය අනුව අනුග්‍රහය ලබාදිය යුතු වන්නේ කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයටද යන වගත්, අනුයුක්ත කලයුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. ප්‍රියමනාප ස්ථාන වල රැඳී සිටීමට මෙම අනුග්‍රහය අදාළ කරගත නොහැක.

**06.** **<u>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු කමිටු කාල සටහන</u>**

| | කාර්යය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | ජුනි මස 01 දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම. | අගෝස්තු මස 06 දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධරයා වෙත ඉදිරිපත් කිරීම. | අගෝස්තු මස 20 දිනට පෙර |
| 04 | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාරදීම | අගෝස්තු මස 25 දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාරදීම | සැප්තැම්බර් මස 10 දිනට පෙර |
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත්කිරීම | සැප්තැම්බර් මස 20 දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | ඔක්තෝබර් මස 10 දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාරදිම | ඔක්තෝබර් මස 20 දිනට පෙර |
| 09 | අවසාන වාර්ෂික ස්ථාන මාරු වීම් නියෝග නිකුත් කිරීම. | නොවැම්බර් මස 01 දිනට පෙර |
| 10 | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම. | ජනවාරි මස 01 දින සිට |

**07.** **<u>වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම.</u>**

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයට එරෙහිව කිසියම් රජයේ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ඇමුණුම 04 යටතේ ඇතුලත් කර ඇති ආකෘතිපත්‍රය ප්‍රකාරව පමණක් ඉදිරිපත් කල යුතු වන්නේය. තවද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කල පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධාරියෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කලයුතු වන්නේ, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මඟින්, අමාත්‍යාංශ ලේකම් මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත යොමු කල යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කලයුතු වන්නේය. නියමිත කාලය තුලදී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාරදෙනු ලබන අභියාචනය අදාල සියළු ලිපිගොනු, ලිපිලේඛන හා වාර්තා ආදියද ඊට අදාල තම නිරීක්ෂණ ද නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුලත ඇමුණුම 05 යටතේ ඇතුලත් කර ඇති ආකෘතිපත්‍රය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධාන හා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වගබලා ගතයුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ එම වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කලයුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා නොබලන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියෙහි සඳහන් ලේඛන ලැබී දින 15 ක් ඇතුලත, ස්ථානමාරු කිරීමේ නියෝගයට එරෙහිව රජයේ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු

යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත හා දෙපාර්තමේන්තු ප්‍රධනියා වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය. එසේ වුවද ඒ සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරීයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු වන්නේය.

මහාචාර්ය පී.බී මණ්ඩාවල
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්